# පටුන


| | | |
|---|---|---|
| 1. | ආයතනික තොරතුරු | 1 |
| 2. | සභාපතිතුමාගේ පණිවුඩය | 2 - 3 |
| 3. | 2010 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තාවන් | |
| | 1. විගණකවරුන්ගේ වාර්තාව | 4 |
| | 2. ශේෂ පත්‍රය | 5 |
| | 3. ආදායම් වාර්තාව | 6 |
| | 4. ස්කන්ධ ප්‍රාග්ධන වෙනස්වීමේ ප්‍රකාශය | 7 |
| | 5. මුදල් ප්‍රවාහන ප්‍රකාශය | 8 |
| | 6. මූල්‍ය ප්‍රකාශවලට සටහන් | 9 - 21 |
| 4. | මූල්‍යමය විශේෂ කරුණු | 22 |

# ආයතනික විස්තර

| | |
|---|---|
| සමාගමේ නම | - සීමා. මිල්කෝ (පුද්.) සමාගම |
| නෛතික තත්වය | - 1982 සමාගම් පනතේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත සීමාසහිත බැරකම් ඇති පුද්ගලික සමාගමකි. |
| ලියාපදිංචි කාර්යාලය | - අංක 45, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.<br>- දුර. 0112586174, 0112582331-4, 0112586872<br>- ෆැක්ස්: 0112368082/ 0115333328<br>- වෙබ් අඩවිය: www.milco.lk<br>- වි- තැපැල : info@milco.lk |
| කර්මාන්තශාලා | - කොළඹ කිරි කර්මාන්තශාලාව (CMF)<br>- අඹේවෙල විසිරි වියළි කිරිපිටි කර්මාන්තශාලාව (SDMF)<br>- දිගන කිරි කර්මාන්තශාලාව (DMF)<br>- පොළොන්නරුව උකු කිරි කර්මාන්තශාලාව (PMF) |
| සංස්ථාගතකළ දිනය | - 1996 මැයි 09 වන දින |
| ප්‍රතිලියාපදිංචිකළ දිනය | - 2008 මැයි 19 වන දින |
| සමාගම් ලියාපදිංචි අංකය | - N (PVS) 17159 (පැරණි)<br>- PV 2942 (නව) |
| සමාගම් ලේකම් | - සීමා. ඉන්ටර්නැෂනල් කන්සල්ටන්සි ඇන්ඩ් කෝපරේට් සර්විසස් (පුද්.) අංක 160, බෞද්ධාලෝක මාවත, කොළඹ 04. |

අධ්‍යක්ෂකවරු

| | |
|---|---|
| - කුමාර් අබේසිංහ මයා | - සභාපති |
| එන්.එම්.කේ.පී. නවරත්න මයා | - නියෝජ්‍ය සභාපති |
| රූමි ජවුෆර් මයා | - ක්‍රියාකාරි අධ්‍යක්ෂක |
| ඩබ්.ඩී.පී. පොන්සේකා මයා | - අධ්‍යක්ෂක |
| ඩී. වෙන්කටේෂ්වරන් මයා | - අධ්‍යක්ෂක |
| සී.බී. හේරත් මයා | - අධ්‍යක්ෂක |
| එස්.අයි.එම්.එම්. නස්වාර් මයා | - අධ්‍යක්ෂක |
| එම්. අනෝමා නන්දනී ජයමහ මිය | - අධ්‍යක්ෂක |

| | |
|---|---|
| විගණනවරු | - අභ්‍යන්තර<br>M/ S එස්ජේඑම්එස් ඇසෝසියේට්ස්, අංක 02. කාස්ල් පටුමග, කොළඹ 04.<br><br>- බාහිර<br>M/S අමරසේකර හා සමාගම<br>අංක 12, රොටුන්ඩා උද්‍යානය, කොළඹ 03. |
| බැංකුකරුවන් | - මහජන බැංකුව<br>ලංකා බැංකුව |

# සභාපතිතුමාගේ ප්‍රකාශනය

2011 මාර්තු 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සමාගමේ කාර්යසාධන විමසුම ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මා අතිශයින්ම සතුටට පත්වෙමි.

සමාලෝචිත වර්ෂයට අදාළ සමාගමේ පිරිවැටුම පසුගිය වසරට වඩා 12% සැළකිය යුතු තලයේ වර්ධනයක් පෙන්වා ඇත. 2009/2010 කාලවල ලත් රු. මිලියන 4.2 ක් වූ පිරිවැටුම හා සංසන්දනාත්මක ව ගත්කළ රු. 4.7 ක සමස්ථ පිරිවැටුමක් ලබා ඇත.

සමාලෝචිත වර්ෂය තුල සමාගමේ ලාභය රු. මිලියන 113 කි. මාස හයක කාලයක් සඳහා කාරක ප්‍රාග්ධනයක් ගොඩනංවා ගන්නා ලෙස මහා භාණ්ඩාගාරය විසින් කරන ලද ඉල්ලීමට අනුව, අද වන විට රු. මිලියන 935 ක මුදල් සංචිතයක් පවත්වා ගෙන යාමට සමාගමට හැකියාව ලැබී ඇත. කිරි, අමුද්‍රව්‍ය, ඇසුරුම්, පඩි නඩි ගෙවීම් වැනි කාර්යයන් සඳහා රු. බිලියන 2.1 ක මුදලක් අවශ්‍යව පවතී. වෙන් කර ඇති කාරක ප්‍රාග්ධන මුදල වසරකට 8.5 -9.0% ක් වන ආකර්ශනීය පොලී අනුපාත මත ලංකා බැංකුව, මහජන බැංකුව හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව වැනි රාජ්‍ය බැංකුවල ස්ථිර තැන්පත් ලෙස බැංකුගත් කර ඇත.

### කිරි එකතු කිරීම හා ප්‍රසම්පාදනය

පැවති දරුණු ගංවතුර තත්වයන් හා ආසන්න වශයෙන් කිරි ගවයන් 75000 ක හිඟයක් පැවති නිසා පසුගිය වසරේ අවසාන භාගයේ දී හා මේ වසර ආරම්භක සමයේ කිරි එකතු කිරීමේ කාර්යයන් අඩාල විය. කෙසේ වුවද, මිල්කෝ සමාගමේ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයේ අප්‍රතිහත කැපවීම හේතුකොටගෙන අද වන විට දිනකට ආසන්න වශයෙන් කිරි ලීටර් 185000 ක් සැළකිය යුතු වර්ධනීය තලයකට ගෙන ඒමට හැකි වී ඇත. ශ්‍රී ලංකාවේ සතර දිග්භාගයෙන්ම මිල්කෝ වෙත කිරි ලබා දෙන ගොවිපාලිත සමිති 2300 ක් හා දිවයින පුරා ශීතාගාර මධ්‍යස්ථාන 77 ක් හරහා කිරි ශීතාගාරගත කිරීමටත් ඒවා කර්මාන්තශාලා හතර වෙත ප්‍රවාහනය කිරීමත් සිදු වේ. එකතු කරන කිරි ප්‍රමාණයන්ගේ විස්තර පහත දක්වා ඇත.

| වසර | ලීටර් (මිලියන) | ප්‍රගතිය % |
|---|---|---|
| 2006 | 53.46 | + 0.97 |
| 2007 | 53.98 | -1.07 |
| 2008 | 53.40 | +2.71 |
| 2009 | 54.85 | +1.20 |
| 2010 | 55.51 | |
| 2011 අද වන විට | 32.56 | |
| 2011 පිහිට. | 61.80 | +11.33 |

### වර්ධනය

කිරි එක්කාසු කරලීමේ කාර්යයන් වතු අංශයේ හා ගම්මාන තුලට විහිදී යාම අත්‍යාවශ්‍ය කරුණකි. එම ප්‍රදේශවල ලීටර් 300, 500 හා 1000 ධාරිතාවය සහිත සුළු පරිමාණ ශීතාගාර 25 ක් ඉදි කිරීමට අපේක්ෂිත ය. කිරි ගොවීන් හට නැවුම් කිරි ලීටරයකට ගෙවන මිල අවම ඝණද්‍රව්‍ය ප්‍රමාණය 12.5% සළකා මනා තත්වයෙන් යුතු කිරි ලීටරයක් වෙනුවෙන් රු. 50/= ක් ගෙවනු ලබයි. අද වන විට මෙසේ කිරි ගොවීන් හට කිරි සඳහා ගෙවෙනු ලබන මිල ලෝක වෙළෙඳපලේ පවත්නා මිලට අඩු වැඩි වශයෙන් වන ඉහළ මුදලකි. මෙකී පියවරයන්ට අමතරව, ස්වයං රැකියා ව්‍යාපෘතියක් ලෙස උදෑසන කාලයේ සුළු පරිමාණ ශීතාගාර වෙතින් කිරි එකතු කිරීමටත් නැවත හවස් වරුවේ මිල්කෝ නිෂ්පාදන අලෙවි කරලිම සඳහා ත්‍රි රෝද රථ 50 ක් යෙදවීමට සමාගම පියවර ගනිමින් සිටී. මෙමගින් දිනකට ආසන්න වශයෙන් රුපියල් 1000/- ක ආදායමක් උපයා දීමට සැළසුම් කර ඇත. සමාගමේ අලෙවි කටයුතු ව්‍යාප්ත කරලීමත් සමාජ සත්කාරක දායකත්වයක් ලෙස මෙම ව්‍යාපෘතිය දිවයින පුරා ගෙන යාමටත් සමාගම බලාපොරොත්තු වේ.

### නැවුම් කිරිවල ගුණත්වය

උසස් ගණයේ ආහාර නිෂ්පාදන ක්‍රියාවලියේ දී කිරිවල ප්‍රමිතිය මනා ලෙස ආරක්ෂා කිරීම අතිශයින්ම වැදගත් වේ. එහි පළමු පියවර ලෙස පසුගිය වසරේ අවසාන කාල සීමාවේ දී ශීතාගාර වල සිට කර්මාන්තශාලා තෙක් කිරි දිනපතා ගෙන යනු ලැබිනි.

ඊට අතිරේකව, නැවුම් කිරි ආශ්‍රිත නිෂ්පාදන හා මූලික සෞඛ්‍යානුකූල කිරි භාවිතාවන් පිළිබඳව ගොවි පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමට පියවර ගෙන ඇත.

### නිෂ්පාදනය

මිල්කෝ සමාගම සතුව නිෂ්පාදන කර්මාන්තශාලා හතරක් කොළඹ (නාරාහේන්පිට), දිගන, අඹේවෙල හා පොළොන්නරුවේ පිහිටුවා ඇත. නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදන සියල්ල ශ්‍රී ලංකාවේ කිරි ගොවීන්ගෙන් එකතු කරගත් නැවුම් කිරි වලින් නිමවා ඇත. "හයිලන්ඩ්" වෙළඳ නාමය යටතේ පාරිභෝගිකයන් හට නිෂ්පාදන ප්‍රභේද දහයක් (10) ක් හා තොග ඒකක පනස් දෙකක් (52) ක් ලබා ගැනීමේ අවස්ථාව ඇත. එම ප්‍රභේද වන්නේ පැස්චරීකරණය කරන ලද හා වාණුහරනයකරලද දියර කිරි, යෝගට්, අයිස් ක්‍රීම්, බටර්, එළඟි තෙල්, චීස්, මුදවපු කිරි, ඝනීභූත කිරි හා පූර්ණ මේදය සහිත කිරිය. මෙහි සඳහන් කළ නිෂ්පාදන ගොන්නට අමතරව, "හයිලන්ඩ් ස්ප්‍රිං" නමින් පානීය ජලය හා චොකලට් හඳුන්වා දීම අපගේ බලාපොරොත්තුවයි.

### විකුණුම් හා අළෙවිය

නිමි භාණ්ඩ බෙදා හැරීම සඳහා රට පුරා බෙදාහරින්නන් 115 ක් මිල්කෝ විසින් පත් කර ඇත. අළෙවි අංශය අලෙවි නියෝජිතයන් 26 ක්, පළාත් කළමනාකරුවන් 07 ක් හා පරිපාලන නිළධාරීන් 06 දෙනෙකු අතින් මෙහෙයවනු ලබයි. මීට අතිරේකව, කාර්ය මණ්ඩල සාමාජිකයන් 50 කින් සමන්විත අළෙවි මධ්‍යස්ථාන 11 ක් සමාගම සතුව ඇත. මේ සඳහා රට කලාප 09 කට බෙදා වෙන් කර ඇති අතර නිෂ්පාදන අලුත් කිරීම් හා නව නිෂ්පාදන හඳුන්වාදීම අඛණ්ඩව සිදු කරනු ලබයි. "මේදය රහිත හා සීනි රහිත" යෝගට් විශේෂයක් මෑතකදී වෙළඳපලට හඳුන්වා දී ඇති අතර එය ක්‍රමානුකූලව පාරිභෝගිකයන් අතර ජනප්‍රියත්වයට පත් වෙමින් පවතී. තවද, ස්ට්‍රෝබෙරි රසැති යෝගට් වර්ගයක් හඳුන්වා දීම සඳහා පාරිභෝගික රසඥතා පරීක්ෂා කිරීමේ කාර්මික අත්හදා බැලීම් මේ වන විට සිදු කර අවසන් කර ඇත. නිෂ්පාදන නවීකරණය අතින් ගත් කළ, ජාත්‍යන්තර තලයෙන් යුත් "හයිලන්ඩ් මිල්ක් මයිට්" වෙළඳ නාමය යටතේ ඝණීභූත කිරි විශේෂයක් හඳුන්වා දී ඇත. මාස 09 ක කෙටි ආයුෂ කාලයක් සහිත මෙම නිෂ්පාදනය විදේශීය වෙළඳපල අරමුණු කොට නිපදවා ඇත.

අඩු කැලරි ප්‍රමාණයක් ඇති අයිස් ක්‍රීම් නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය අත්හදා බැලීම් සිදු කිරීමට වැඩිදුරටත් කටයුතු කරමින් පවතී.

### යූඑච්ටී (UHT)

මසක කාලයක් රාක්කවල තබා ගත හැකි දිගු කාලීන යූඑච්ටී කිරි නුදුරු අනාගතයේ හඳුන්වාදීමට හැකිවීම අතිශයින්ම වැදගත් වර්ධනීය පියවරකි. අද පවත්නා පැස්චරීකරණය කරන ලද දියර කිරි තබා ගත හැක්කේ දින තුනක් (3) ක් පමණක් වන නිසා එම කෙටි ජීවි කාලය සළකා ඒවා බෙදා හැරීම අපහසු කාර්යයක් බවට පත් වි ඇත. මූලික නිකුත් කිරීමේ දී රු. 25/- ක් මිල වන මි.ලී. 180 (රස 2 ක් සහිත), රු. 50/- ක් මිල කර ඇති මි.ලී. 450 ක් සහ මි.ලී. 900 කින් යුතු රු. 90/- ක් වන ඇසුරුම් වර්ග තුනක් ලෙස ඉදිරිපත් කිරිමට අපේක්ෂිතය. මෙතෙක් කල් කිරි පිටි භාවිතාවට හුරුව සිටි අප පාරිභෝගිකයන් ද්‍රව කිරි භාවිතයට හුරු කර වන සමයක ආරම්භය මෙය වේ.

### මිල්කෝ කාර්ය මඬුල්ල

" වෘත්තීය ප්‍රවේශ සංවර්ධනය" ඇති කරලීම අප කාර්ය මණ්ඩලය සඳහා අතිශය අවශ්‍ය වි ඇති දෙයකි. විවිධ වෘත්තීය තලයන් වලට අයත් කාර්ය මණ්ඩලයන් උදෙසා පුහුනුවීම් දැනටමත් අරඹා ඇත. වර්ෂාවසාන කාර්ය මණ්ඩල ඇගයීම් කරලීම සඳහා ප්‍රමුඛ කාර්යසාධන දර්ශකයන්ගෙන් සමන්විත කාර්යසාධන සංවර්ධන මාර්ගෝපදේශයක් සැකසීමට බලාපොරොත්තු වේ. අත්දැකීම් වලින් පිරිපුන් කාර්ය මඬුල්ලක් යනු මිල්කෝ අපට සම්පතක් වනවා වන අතර සමාගම තුල සියලු සේවා ඛාණ්ඩයන්ට 1430 කින් යුත් සේවක පිරිසකින් සමන්විතය.

### ඉදිරි ගමන

ශ්‍රී ලංකානු ජනතාව හට අවශ්‍ය කරන පෝෂ්‍යදායී ආහාර ලබා දීම සඳහා මිල්කෝ සමාගම ඇපකැප වී සිටි. අත දරුවාගේ සිට මහලු වියේ පසුවන්නන් දක්වා සමාජයේ සිටින සියලු ආකාර වල පාරිභෝගික කණ්ඩායම් සඳහා නිෂ්පාදන පෙලක් මිල්කෝ නිපදවා ඇත. ඒවා "ජනප්‍රියට පත් වූ නිෂ්පාදන" තේමා පාඨය යටතේ සකසා ඇත. හුදු "ආහාර පාන සමාගමක" තත්වයේ සිට ජාතියට පෝෂණය සපයන "පෝෂ්‍යදායි ආහාර පාන සමාගමක්" බවට මිල්කෝ පත් වී ඇත. ජනයාට සේවය සළසන හා ආයතනය ආරක්ෂා කරන ශ්‍රී ලංකාවේ පළමු පංතියේ සමාගම බවට පත්වීමේ මගසළකුනු මිල්කෝ සමාගම දැනටමත් පහල කර ඇත.

### පොදු

ජයග්‍රාහී මාවතට පිවිසීම සඳහා සුළු කරුණු කිහිපයක් පමණක් සපුරා ලීමට මිල්කෝ හට සිදු වී ඇත. සමාගමේ වර්ධනය අඩාල කරවන ප්‍රමාණවත් නැවුම් කිරි ප්‍රමාණයක් රටේ නොමැතිවීම ප්‍රධාන බාධකය බවට පත් වී ඇත. රටේ කිරි ආශ්‍රිත නිෂ්පාදන ක්ෂේත්‍රයේ සියයට පනහක අලෙවි දායකත්වය තම අතට ගැනීම අපගේ ප්‍රධාන ඉලක්කයයි. වසරකට ශ්‍රී ලංකාව ආසන්න වශයෙන් ඇමෙරිකන් ඩොලර් මිලියන 390 ක් වටිනාකමැති කිරි ආහාර අපනයනය කරයි. ආනායනය කිරීම් නවතා විදේශ විනිමය ආරක්ෂා කර ගැනීම සඳහා ලංකාවට වසරකට නැවුම් කිරි ලීටර් මිලියන 600 ක් නිෂ්පාදනය කළ යුතුව ඇත.

මේ වන විට එම ප්‍රමාණය වසරකට ලීටර් මිලියන 125 කි. ප්‍රායෝගිකව ගත් කළ මෙම කර්තව්‍යය ජය ගත හැකි ආකාරයේ එකකි. පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය නැවුම් කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම අරමුණු කර පියවර රැසක් අරඹා ඇත. 2015 වසරේ දී නැවුම් කිරි අතින් ස්වයං පෝෂිත තත්වයට පත්වීම අපගේ අරමුණයි.

අවසාන වශයෙන්, මිල්කෝ ඉදිරි ගමන වෙනුවෙන් දායකත්වය සපයන සැමට විශේෂයෙන් කිරි ක්ෂේත්‍රයේ නිරත සියලු දෙනා හට මිල්කෝ අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් මා ස්තූතිවන්ත වෙමි.

**සභාපති**
**සීමාසහිත මිල්කෝ (පුද්.) සමාගම**

සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගමේ සාමාජිකයින් වෙත

මූල්‍ය ප්‍රකාශන මත වාර්තාව

1. අප විසින් 2010 මාර්තු 31 වන දිනට ශේෂ පත්‍රය සහ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය සහ පිටු අංක 02/18 දක්වා, දක්වා ඇති වෙනත් පැහැදිලි කිරීමේ සටහන් වලින් යුක්ත වූ සීමාසහිත මිල්කෝ පුද්ගලික සමාගමේ මූල්‍ය ප්‍රකාහනයන් පිළිබද විගණනයක් කරන ලදී.

මූල්‍ය ප්‍රකාශනයන් පිළිබද කළමනාකරණයේ වගකීම

2. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙළ කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීමකි. මෙම වගකීමට වැරදි සහ වංචා හේතුවෙන්; අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීමේදී සහ අදාළ කර ගැනීමේදී; සහ අවස්ථානුකූලව සාධාරණයැයි සිතන ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමේදී විය හැකි සැලකිය යුතු සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිලියෙළ කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සඳහා අදාල වන අභ්‍යන්තර පාලනයන් නිර්මාණය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ එය මනා ලෙස පවත්වාගෙන යාම අන්තර්ගත වේ.

විගණනයේ විෂය පථය සහ මතයේ පදනම

3. අපගේ වගකීම වන්නේ අපගේ විගණනය පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන මත මතයක් ප්‍රකාශ කිරීමයි. අප විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව අපගේ විගණනනය පවත්වන ලදී. එම ප්‍රමිතීන් අවශ්‍ය වන්නේ මූල්‍ය ප්‍රකාශනයන් සැලකිය යුතු වැරදි ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ විනිශ්චයක් ලබා ගැනීම සඳහා අපගේ විගණනය සැලසුම් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමටයි.

4. විගණනයක් මගින් මූල්‍ය ප්‍රකාශනයන්ගෙන් ඉදිරිපත් කරන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන සාක්ෂි අත්හදා බැලීමේ මට්ටමින් පරීක්ෂණයට ලක් කිරීම අන්තර්ගත වේ. එලෙසම විගණනයක දී භාවිතයට ගනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ කළමනාකරණය විසින් ගනු ලැබූ වැදගත් තක්සේරුන්, එමෙන්ම සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශනයන්ගේ ඉදිරිපත් කිරීම ඇගයීමකට ලක් කිරීමද අන්තර්ගත වේ.

5. අප විසින්, හත, අට, නවය, දහය යන පරිච්ඡේදයන්හි දක්වා ඇති කරුණු හැර, අපගේ විගණනයේ පරමාර්ථ සඳහා අවශ්‍ය වූ සියලුම තොරතුරු හා පැහැදිලි කිරීම් අපගේ උපරිම දැනුම හා විශ්වාසය අනුව ලබා ගතිමු.

මතය

6. අපගේ මතයෙන්, පහත සදහන් පරිච්ඡේද හත, අට, නවය සහ දහය (ඉලක්කමෙන් 7,8,9,10), තුළ අවධානයට යොමු කළ කරුණු නිවැරදි කිරීම නිසා මූල්‍ය ප්‍රකාශන වලට ඇතිවිය හැකි බලපෑම හැර, මෙතෙක් පෙන්නුම් කළ අපගේ පරීක්ෂණයන්ගෙන් සමාගම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් වලට අනුකූලව 2010 මාර්තු 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ක්‍රමවත් ගිණුම් වාර්තා පවත්වාගෙන ගොස් ඇති බවටත්, සහ මූල්‍ය වාර්තා 2010 මාර්තු 31 වන දිනට සමාගමේ කාර්යයන් හා එහි ප්‍රතිඵල වලින් සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ මගින්ද සත්‍ය සහ සාධාරණ තත්වයක් පෙන්නුම් කරනු ලබන බවටත් ප්‍රකාශ කරමු.

7. බර තැබූ පිරිවැයහි සාමාන්‍ය ගණනයේදී සිදුවූ වරදක් හේතුවෙන් දේපළ, පිරියත සහ උපකරණවල අන්තර්ගත ගොවිපොළ ටැංකි පිරිවැය රුපියල් මිලියන 7.5 ක් වැඩියෙන් දක්වා තිබේ.

8. ශේෂ පත්‍ර දිනට ලෙජරයේ වාර්තා කර ඇති ශේෂය සහ වැටුප් පද්ධතියේ දක්වා ඇති ශේෂය අතර ආපදා ණය ශේෂයේ රුපියල් මිලියන 12.5 ක වෙනසක් හඳුනා ගැණිනි.

9. රඳවා ගත් තැන්පතු හා සැසදෙන වර්ෂය පුරා පැවති වත්කම් (බෝතල් සහ බහලුම්) හදුනා ගනු නොලැබිණි. ඒ හේතුවෙන් ශේෂ පත්‍රය අනුව රඳවා ගනු ලැබ ඇති රුපියල් මිලියන 31.4 ක අගය ඇති තැන්පතුවල වටිනාකම ඊට අනුරූපවන භෞතික වත්කම් සාධාරණව නිරූපණය කරන්නේදැයි සැකයක් පවතී.

10. තවදුරටත්, අප සමාන දිනෙක කළමණාකරණයට ඉදිරිපත් කළ කළමණාකරණ වාර්තාවේ පෙන්නුම් කළ සහ වාර්තා කළ කාරණා වෙත අවධානය යොමු කරමු. මෙම වාර්තාව කළමනාකරණය වෙත ඉදිරිපත් කළ කළමනාකරණ වාර්තාව හා සබැඳිව කියවිය යුතුව ඇත.

අවධානයට ලක් කළ කරුණු

11. මතය වියාවනය කිරීමෙන් තොරව, අප ලිඛිත සාක්ෂි නොමැති වීම නිසා සීමාසහිත කිරියා කිරි කර්මාන්ත (පුද්ගලික) සමාගමෙන් අත්පත් කරගත් සැබෑ වගකීම් හෝ එම වගකීම් ආපසු ගෙවීමේ කොන්දේසි පිළිබද සත්‍යාපනයක් කළ නොහැකි බව මූල්‍ය ප්‍රකාශනයෙහි සටහන් 13.2 වෙත අවධානය යොමු කරමු.

වෙනත් නීතිමය සහ නියාමන අවශ්‍යතාවයන් මත වාර්තා කිරීම්

12. 2007 අංක 7 දරණ සමාගම් පනතේ 151 (2) ඡේදයේ නියමයන්ට මෙම මූල්‍ය ප්‍රකාශනයන් අනුකූල වේ.

වරලත් ගණකාධිකාරීන්
කොළඹ

# 2010 මාර්තු 31 දිනට ශේෂ පත්‍රය

| | සටහන | 2010 රුපි. | 2009 රුපි. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ | 3 | 572,074,407 | 607,598,450 |
| පශු සම්පත් | | 444,255 | 407,971 |
| | | **572,518,661** | **608,006,421** |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 4 | 530,342,807 | 343,534,136 |
| වෙළඳ සහ වෙනත් ලැබීම් | 5 | 734,377,711 | 610,576,211 |
| අයකරගත හැකි බදු | | 10,493,879 | 10,493,879 |
| කෙටි කාලීන තැන්පතු | | 1,031,983,287 | 1,023,919,441 |
| මුදල් හා ඒ හා සමාන දේවල් | | 85,400,020 | 43,490,533 |
| | | **2,392,597,703** | **2,032,014,200** |
| **මුළු වත්කම්** | | **2,965,116,364** | **2,640,020,621** |
| **හිමිකම් සහ වගකීම්** | | | |
| **ප්‍රාග්ධනය සහ සංචිත** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 6 | 306,500,020 | 306,500,020 |
| යන්ත්‍රෝපකරණ ප්‍රතිස්ථාපනය සහ ඉහළ නැංවීම | 7 | 25,000,000 | 25,000,000 |
| නිදන් අරමුදල | 8 | 1,689,978 | 1,689,978 |
| සංචිත ප්‍රත්‍යාගණනය | | 336,454,462 | 336,454,462 |
| රඳවාගත් ඉපැයුම් | | 1,108,087,428 | 836,699,281 |
| **හිමිකම් එකතුව** | | **1,777,731,889** | **1,506,343,742** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| පොලී සහිත ණය සහ ණයට ගැනුම් | 9 | 2,531,302 | 7,208,907 |
| පොලී රහිත ණය | 10 | 83,590,654 | 83,590,654 |
| විලම්බිත රාජ්‍ය ප්‍රතිපාදන | 11 | 22,567,086 | 21,953,383 |
| වෙනත් විලම්බිත වගකීම් | 12 | 125,097,698 | 103,544,305 |
| | | **233,786,740** | **216,297,249** |
| **ජංගම වත්කම්** | | | |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දේ | 13 | 797,110,764 | 801,678,569 |
| ආදායම් බදු වගකීම | | 65,578,394 | 52,512,635 |
| ණය සහිත පොලී සහ ණයට ගැනුම් | 9 | 90,908,579 | 63,188,426 |
| | | **953,597,736** | **917,379,630** |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | **2,965,116,365** | **2,640,020,621** |

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 7 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

***ප්‍රධාන මූල්‍ය නිලධාරී***

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.
මෙම මූල්‍ය ප්‍රකාශන  දින මණ්ඩලය විසින් අනුමත කර ඇත.

මණ්ඩලය සඳහා සහ වෙනුවෙන් අත්සන් කළේ,

***අධ්‍යක්ෂ*** ***අධ්‍යක්ෂ***

**කොළඹ**

# 2010 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

| | සටහන | 2010 රුපි. | 2009 රුපි. |
|---|---|---|---|
| **ආදායම්** | **14** | 4,093,051,886 | 4,242,074,424 |
| **විකුණුම් පිරිවැය** | | (3,395,561,341) | (3,510,676,580) |
| **දළ ලාභය** | | **697,490,545** | **731,397,844** |
| **වෙනත් ආදායම්** | **15** | 102,164,981 | 108,155,924 |
| **බෙදාහැරීමේ වියදම්** | **16** | (100,074,952) | (80,936,209) |
| **පරිපාලන වියදම්** | **17** | (332,794,333) | (377,459,901) |
| **වෙනත් වියදම්** | **18** | (27,097,320) | (27,650,520) |
| **මූල්‍ය පිරිවැය** | **19** | (964,195) | (1,770,036) |
| **බදු පෙර ලාභය** | **20** | **338,724,726** | **351,737,102** |
| **ආදායම් බදු වියදම්** | **21** | (27,871,953) | (19,580,847) |
| **වසර සඳහා ලාභය** | | **310,852,773** | **332,156,255** |
| **කොටසක මූලික ඉපැයුම (රුපි.)** | **22** | **10.14** | **10.84** |

# 2010 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය

| | කොටස් ප්‍රාග්ධනය රුපි. | ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපි. | ප්‍රාග්ධන සංචිත රුපි. | ප්‍රත්‍යාගණන සංචිත රුපි. | නිදන් අරමුදල රුපි. | රඳවාගත් ඉපැයුම් රුපි. | එකතුව රුපි. |
|---|---|---|---|---|---|---|---|
| **2008 අප්‍රේල් 01 දිනට ශේෂය** | **306,500,020** | | 25,000,000 | | **1,682,418** | **429,636,979** | **762,819,417** |
| ප්‍රකාශිත ප්‍රාග්ධනයට මාරු කළා | (306,500,020) | 306,500,020 | | | - | - | - |
| වසර සඳහා ලාභය | - | - | - | - | - | 332,156,255 | 332,156,255 |
| ඒකාබද්ධ අරමුදලට මාරු කළා - (ලාභාංශ) | - | - | - | - | - | (5,500,000) | (5,500,000) |
| ප්‍රත්‍යාගණන සංචිත | - | - | - | 336,454,462 | - | - | 336,454,462 |
| උපකල්පනවල වෙනස්වීම් නිසා පැන නැගුන හෝ පසුගිය වර්ෂයේ (අධි)/ උෟණ ප්‍රතිපාදන හේතුවෙන් ඇතිවූ | - | - | - | - | - | 80,412,977 | 80,412,977 |
| නිදන් අරමුදලට මාරු කළා | - | - | - | - | 6,930 | (6,930) | - |
| භාජන අපහරණයෙන් ලැබුණ ලාභ | - | - | - | - | 630 | - | 630 |
| **2009 මාර්තු 31 දිනට ලාභය** | **-** | **306,500,020** | **25,000,000** | **336,454,462** | **1,689,978** | **836,699,281** | **1,506,343,741** |
| වසර සඳහා ලාභය | - | - | - | - | - | 310,852,773 | 310,852,773 |
| ඒකාබද්ධ අරමුදලට මාරු කළා - (ලාභාංශ) | - | - | - | - | - | (39,464,626) | (39,464,626) |
| ප්‍රත්‍යාගණන සංචිතය | - | - | - | - | - | - | - |
| උපකල්පනවල වෙනස්වීම් නිසා පැන නැගුන හෝ පසුගිය වර්ෂයේ (අධි)/ උෟණ ප්‍රතිපාදන හේතුවෙන් ඇතිවූ | - | - | - | - | - | | - |
| නිදන් අරමුදලට මාරු කළා | - | - | - | - | | | - |
| භාජන අපහරණයෙන් ලැබුණ ලාභ | - | - | - | - | | - | |
| **2010 මාර්තු 31 දිනට ලාභය** | **-** | **306,500,020** | **25,000,000** | **336,454,462** | **1,689,978** | **1,108,087,428** | **1,777,731,889** |

# 2010 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සටහ | 2010 රුපි. | 2009 රුපි. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| බදු පෙර ලාභය | | 338,724,726 | 351,737,102 |
| | | | |
| **ගැලපුම්;** | | | |
| ඉදිරියට ගෙනා ලාභය ගැලපීම | | - | - |
| ක්ෂය | | 208,191,757 | 191,112,761 |
| ආයෝජන ආදායම් | | (88,453,539) | (67,806,794) |
| දේපළ, පිරියත හා උපකරණ විකිණීම මත (ලාභය) / අලාභය | | (2,090,431) | (399,460) |
| අඩමාණ ණය වෙන් කිරීම | | - | (1,333,108) |
| පොලී වියදම් | | 964,195 | 1,770,036 |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා වෙන් කිරීම – පාරිතෝෂික | | 31,794,745 | 34,497,239 |
| ආපසු ලිවීම – ප්‍රතිපාදන | | (583,453) | (1,359,963) |
| ප්‍රත්‍යාගණන අලාභ | | - | 41,578,456 |
| තොග කපා හැරීම | | 25,778 | 23,813 |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය/ (අලාභය)** | | **488,573,777** | **549,820,081** |
| | | | |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම් ;** | | | |
| තොග | | (186,870,733) | (31,241,879) |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු | | (123,801,500) | (25,728,877) |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු | | (4,567,806) | 94,429,097 |
| **මෙහෙයුම් වලින් උත්පාදනය කළ/ (සඳහා භාවිතා කළ) මුදල්** | | **173,333,738** | **587,278,422** |
| | | | |
| ගෙවූ පොලී | | (964,195) | (3,256,610) |
| ගෙවූ පාරිතෝෂික | | (10,241,352) | (6,037,162) |
| ගෙවූ ආදායම් බදු | | (24,909,378) | (88,534) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබුණ/ (භාවිතා වූ) ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **137,218,813** | **577,896,115** |
| | | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ලද මූල්‍ය ප්‍රවාහය** | | | |
| දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම | | (172,971,880) | (161,033,169) |
| දේපළ, පිරියත හා උපකරණ විකිණීමෙන් ලද මුදල් | | 2,394,598 | 399,460 |
| ගෙවූ ලාභාංශ | | (29,361,442) | - |
| ලබූ පොලී | | 81,432,195 | 60,800,339 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල්** | | **(118,506,529)** | **(99,833,370)** |
| | | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| පොලී සහිත ණය සහ ණයට ගැනුම් ආපසු ගෙවීම | | (4,055,619) | (3,440,248) |
| කෙටි කාලීන ණය සහ ණයට ගැනුම් වලින් ලද ශුද්ධ මුදල් | | 1,197,156 | 12,954,033 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල** | | **(2,858,464)** | **9,513,785** |
| | | | |
| **මුදල් සහ මුදල් හා සමාන දේ වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම)** | | **15,853,821** | **487,576,530** |
| | | | |
| **වසර ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දේ** | | **988,537,684** | **500,961,154** |
| | | | |
| **වසර අග මුදල් හා මුදල් හා සමාන දේ** සටහන් | **23** | **1,004,391,505** | **988,537,684** |

## 1. ආයතනික තොරතුරු

### 1.1.1 පොදු

සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගම ("සමාගම") යනු ශ්‍රී ලංකාවේ පිහිටා තිබෙන සංස්ථාගත කර ඇති සීමාසහිත වගකීම දරණ සමාගමකි.

"සීමාසහිත ලංකා කිරියා කිරි කර්මාන්ත (පුද්.) සමාගම" ලෙස 1996 මැයි 09 වන දින සමාගම සංස්ථාගත කර ඇත. සමාගමේ නම සීමාසහිත මිල්කෝ පුද් ලෙස 2001 ජූලි 23 වන දින සිට වෙනස් කර ඇත. ශ්‍රී ලංකා රජය (GOSL) හා ඉන්දියානු ජාතික කිරි සංවර්ධන මණ්ඩලය (NDDB) අතර ඇති කර ගත් ගිවිසුම ප්‍රකාරව, සීමාසහිත ලංකා කිරි නිෂ්පාදන සමාගමට අයත් එය 1998 පෙබරවාරි 03 වන දින වන විට භාවිතා කරනු ලබන සියලු දේපල, පිරියත හා උපකරණ (ඉඩම හැර) සහ සීමා. ලංකා කිරි නිෂ්පාදන සමාගම විසින් එම දිනය වන විට භාවිතා කරන ඉඩම් හා ගොඩනැගිලිවල බදු අයිතිය 1998 පෙබරවාරි 04 වන දින සිට සමාගම වෙත මාරු කර තිබේ. එසේ මාරු කරන ලද ශුද්ධ වත්කම්වල වටිනාකම රු. 306, 500,020/- කි. තවද, 2000 අගෝස්තු 08 දිනැති ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ප්‍රතිසංස්කරණ කොමිසමෙහි ලිපියට අනුව බදුගත් ඉඩම හා ගොඩනැගිලි වල වාර්ෂික කල්බදු කුලිය වන රු. 20, 427,900/- මුදල ඒකාබද්ධ ව්‍යාපාර බවට පත් කිරීමේ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව කපා හැර ඇත. ඒකාබද්ධ ගිවිසුම වැඩි කලක් බලාත්මක නොවුවද එකී රජයේ ඉඩම හා ගොඩනැගිලි වලට අදාළව ගිණුම් යථා පරිදි ගැලපීම් සිදු කිරීමට සමාගම පියවර ගෙන නැත.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 05, නාරාහේන්පිට, නාවල පාරේ, අංක 45 යන ස්ථානයේ පිහිටා ඇති අතර ප්‍රධාන ව්‍යාපාරික කටයුතු ද එම ස්ථානයේ සිදු කරනු ලබයි. නාරාහේන්පිට, අඹේවෙල, දිගන හා පොළොන්නරුව යන ස්ථානවල සමාගමේ ප්‍රධාන කර්මාන්තශාලා පිහිටා ඇත.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම් ආකාරය

කිරි එකතු කිරීම, සැකසීම, ඇසිරීම, බෙදාහැරීම හා එම නිෂ්පාදන අලෙවි කිරීම සමාලෝචිත වර්ෂය තුල සමාගම විසින් සිදු කළ ප්‍රධාන ක්‍රියාකාරකම් ය.

### 1.3 සේවක සංඛ්‍යාව

වසර අවසානය වන විට සමාගමේ සේවයේ නිරත කාර්ය මණ්ඩලය 1,523 (31.03.2009-1,490) ක් විය.

## 2. ප්‍රධාන ගිණුම් ප්‍රතිපත්තිවල සාරාංශය

### 2.1 පොදු ප්‍රතිපත්ති

### 2.1.1 සැකසීමේ පදනම

2010 මාර්තු 31 වන දින වන විට හා වසර අවසානය වන විට සමාගමේ ශේෂ පත්‍රය, ආදායම් ප්‍රකාශනය, සමකොටස් හා මූල්‍ය ගලන වෙනස්වීම් සමඟ ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් ("මූලය ප්‍රකාශන") ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව සියලු ආකාරයෙන් ගැලපේ.

මෙම මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකසා ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත.

### 2.1.2 සන්සන්දනාත්මක තොරතුරු

සමාගම නිරතුරුව ගිණුම් ප්‍රතිපත්ති අනුගමනය කර ඇති අතර ඒවා පෙර වසර හා නිසි ලෙස ගැලපේ.

මෙම වසරේ ඉදිරිපත් කිරීම් වලට ගැලපෙන පරිදි පෙර වසරේ සංඛ්‍යාලේඛන හා වාක්‍ය කණ්ඩ අවශ්‍ය පරිදි ප්‍රතිසැකසීමකට භාජනය කර ඇත.

### 2.1.3 විදේශීය මුදල පරිවර්තනය

සියලුම විදේශ විනිමය ගණුදෙනු භාවිත මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කර ඇති අතර එය ගණුදෙනු සිදු කරන සමය වන විට භාවිත විනිමය අනුපාත වලට සමානව සිදු කර ඇත. විදේශීය මුදල්වල භාවිත මූල්‍යමය වත්කම් හා බැරකම් ශ්‍රී ලංකා රුපියල් වලට සමාන මුදලට වසරාවසාන විනිමය අනුපාත වලට අනුකූලව පරිවර්තනය කර ඇත. මූල්‍යමය නොවන වත්ක්ම හා බැරකම් එවකට පැවති විනිමය අනුපාත භාවිතා කර පරිවර්තනය කර ඇත. වටිනාකම් තීරණය කරන අවස්ථාව වන විට අත්වන ලාභ හා පාඩු ආදායම් ප්‍රකාශනය තුල දක්වා ඇත.

**2.1.4 බදු ගෙවීම්**

**(අ) තථ්‍ය බදු**

2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව සමාගමේ ලාභ 2006 අප්‍රියෙල් 01 වන දින සිට වසර 05 ක කාලයක් සඳහා නිදහස් කර ඇත.

**(ආ) විලම්බිත බදු**

බැරකම් ක්‍රමය මත විලම්බිත බදු සකසා ඇත. ආදායම් බදු සඳහා අයිතම යොමු කරන විට මූල්‍ය ප්‍රකාශනවල ඒවා හඳුනාගන්නා කාලය වන විට සිදු වන සියලු කාල වෙනස්කම් වලට අදාළ බදු බලපෑම වත්මන් බදු අනුපාත වෙන්කිරීම් වල ඇතුළත් කර ඇත.

සියලු අඩුකළ හැකි කාල වෙනස්කම් හා අභාවිත බදු පාඩු ගලාඒම් වලට උචිත පරිදි විලම්බිත බදු වත්කම් හඳුනාගෙන ඒවා බදු වලට යටත් ලාභය අභාවිත බදු පාඩු වල ගලනයන් හා අඩුකළ හැකි කාල වෙනස්කම් වලට සරිලන ලෙස භාවිතා කිරීමට කටයුතු සළසා ඇත. විලම්බිත බදු වත්කම්වල ධාරන අගය එක් එක් ශේෂ පත්‍ර දිනයට අදාළව සළකා, ප්‍රමාණවත් බදු පැනවිය හැකි ලාභය තවදුරටත් ලබා ගත නොහැකි වන පරිදි අඩු කර විලම්බිත බදු වත්කම එලෙසින්ම හෝ ඉන් කොටසක් ලබා ගත හැකි පරිදි භාවිතා කර ඇත.

කෙසේ වුවද, සමාගමට ලබා දී ඇති බදු විරාම කාලය හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන තුල විලම්බිත බදු සඳහා කිසිදු වෙන්කිරීමක් සිදු කර නැත.

**2.2 වත්කම් තක්සේරුව හා ඒවා ගණනය කිරීමේ පදනම**

**2.2.1 තොග**

අවම පිරිවැය හා ශුද්ධව අත්වන වටිනාකම මත අඩු ඉල්ලුමක් ඇති සහ යල්පිනු අයිතම සඳමා සාධාරණ සැලකිල්ලක් දැක්වීමෙන් දක්වා තොග තක්සේරු කිරීම කර ඇත. ශුද්ධ අත්වන වටිනාකම යනු තොග සාමාන්‍ය විකුණුම් ක්‍රමයට අනුව ඇස්තමේන්තුගත නිමැවුම් පිරිවැයට අඩුවෙන් හා අලෙවිය සඳහා ඇස්තමේන්තුගත පිරිවැය සකසා ගැනීමේ මිල ගණන්ය.

තොගවල තථ්‍ය වටිනාකම් පිරිවැය ගණනය කිරීමේ දි සිදු වු හා සිදු කිරීමට අවශ්‍ය වු තත්වයන් පහත පිරිවැය ක්‍රමවේදයන් අනුව සිදු කර ඇත.

| | |
|---|---|
| ද්‍රව්‍ය | - පිරිවැය මත |
| නිමි ද්‍රව්‍ය | - දිගන හා කොළඹ කිරි කර්මාන්තශාලා - පිරිවැය මත |
| | - අඹේවෙල - පිරිවැය මත |
| | - ගව ආහාර - පිරිවැය මත (බර තැබූ පදනම මත පිරිවැය හඳුනාගෙන ඇත) |
| නොනිමි කාර්යය | - යෙදවුම් ද්‍රව්‍ය වල පිරිවැය මත |
| වෙනත් තොග | - (උදා, භාවිත දෑ & වැඩිපුර) - පිරිවැය මත (බරතැබූ සාමාන්‍යය අනුව) මාර්ගස්ථ භාණ්ඩ - පිරිවැය මත |

**2.2.2 වෙළඳ හා වෙනත් ලැබීමට නියමිත දෑ**

වෙළඳ ලැබීමට ඇති දෑ බොල් හා අඩමාන ණය වෙන් කිරීම්වල ශුද්ධ පුරෝකථන අගය අනුව සංඛ්‍යාත්මකව දක්වා ඇත. වෙනත් ලැබීමට නියමිත දෑ අඩමාන හා බොල් ණය සඳහා වු අවම පිරිවැය වෙන් කිරිම අනුව හඳුනා ගෙන ඇත.

**2.2.3 මුදල් හා මුදල්වලට සමාන දෑ**

මුදල් හා මුදල්වලට සමාන දෑ ලෙස අතැති මුදල්, ඉල්ලුම් තැන්පත් හා කෙටිකාලීන ඉහළ ද්‍රවශීලී ආයෝජන, මුදල් බවට කඩිනමින් පත් කර ගත හැකි මුදල් සහ වටිනාකම වෙනස්වීමේ දැඩි අවදානමට පාත්‍ර විය හැකි දෑ ඇතුළත් වේ.

මූල්‍ය ගලන ප්‍රකාශනය, මුදල් හා මුදල් වලට සමාන දෑ අතරට අතැති හා බැංකුවල තැන්පත් මුදල්, ක්‍රියාත්මක බැංකු අයිරා වල ශුද්ධ අගය, කෙටි කාලීන කල්පිරෙන ආයෝජන (උදා- පවරාගන්නා දිනයේ සිට මාස තුනක් හෝ ඊට වඩා අඩු) වැනි දෑ මුදල් වලට සමාන දෑ සනයට අයත් වේ.

### 2.2.4 දේපල, පිරියත හා උපකරණ

**(අ) පිරියත**

දේපල, පිරියත හා උපකරණ පිරිවැය සමුච්චිත අගය අඩුවීම මත දක්වා ඇත. මෙම මූල්‍ය ප්‍රකාශනවල 1.1 සටහනේ දක්වා ඇති ගිවිසුමට අනුව සීමාසහිත ලංකා කිරි සමාගමට අයත් එය භාවිතා කරන දේපල, පිරියත හා උපකරණ සමාගම වෙත රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් ගණනය කළ තක්සේරුවට අනුව මාරු කළ යුතුව ඇත.

කෙසේ වුවද, ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගත කිරීමේ කොමිසම 2000 අගෝස්තු 08 දිනැති තම ලිපිය මගින් උපදෙදස් දුන් ආකාරයට එම අගයන් නොමැතිව වුවද, 1998 පෙබරවාරි 03 වන දින වන විට සීමාසහිත ලංකා කිරි නිශ්පාදන සමාගමෙහි පොත්පත් වල සඳහන් ව තිබූ දේපල, පිරියත හා උපකරණ සමාගමේ පොත් වටිනාකම් වලට මාරු කර ඇත.

මෙකී දේපල, පිරියත හා උපකරණ වලට අදාලව කිසිදු භෞතික සත්‍යාපනයක් මෙම වත්කම් සමාගමට භාර දෙන දිනය වන විට සිදු කර නැත. සීමාසහිත කිරි නිෂ්පාදන සමාගම සතු වෙනත් දේපල හැර ඉඩම හා ගොඩනැගිල්ල දේපල, පිරියත හා උපකරණ යටතේ හුවා දක්වා නැත.

**(ආ) පිළිසකර පිරිවැය**

මූලික කාර්යසාධන තලයන් නිසා ඇති වෙයැයි බලාපොරොත්තු වන ඉදිරි ආර්ථික ප්‍රතිලාභ පවත්වාගෙනයාම හෝ පිළිසකර කිරීම සඳහා දේපල, පිරියත හා උපකරණ අලුත්වැඩියාවන් හෝ නඩත්තු සඳහා කර ඇති වියදම් ඒවා සිදුවන අවස්ථාවන්ට අදාලව වියදමක් ලෙස හඳුනා ගෙන ඇත.

**(c) ක්ෂයවීම්**

ක්ෂයවීම් සඳහා වු වෙන්කිරීම් සරල රේඛිය ක්‍රමය මත භුක්තියට ලක්ව ඇති ඉඩම හැර වෙනත් සියලුම දේපල, පිරියත හා උපකරණ භාවිතා කර ගණනය කර ඇත. එහිදී පහත දැක්වෙන ඇස්තමේන්තුගත භාවිත කාල සීමාවන් පෙර සඳහන් වෙන් කිරීම් කපා හැරීම් සඳහා යොදා ගෙන ඇත.

| | |
|---|---|
| ගොඩනැගිලි | වසර 20 ට වැඩි |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | වසර 06 සිට 10 දක්වා |
| ලී බඩු හා මෙවලම් | වසර 03 සිට 05 දක්වා |
| විද්‍යාගාර උපකරණ | වසර 03 සිට 05 දක්වා |
| රථවාහන | වසර 02 සිට 04 දක්වා |
| ආයුද හා උපකරණ | වසර 03 සිට 10 දක්වා |
| කාර්යාලීය උපකරණ | වසර 2.5 සිට 05 දක්වා |
| බෝතල් හා ඇසුරුම් භාජන | වසර 04 ට වැඩි |
| පරිඝණක | වසර 02 සිට 04 දක්වා |
| බෝතල් සිසිල්කරණ | වසර 2.5 සිට 04 දක්වා |
| මාදුකාංග | වසර 03 ට වැඩි |
| කිරි භාජන | වසර 05 ට වැඩි |

### 2.2.5 කල්බදු

**මූල්‍ය කල්බදු**

කල්බදු අයිතමයේ හිමිකාරත්වයට අදාළ වාසි හා අවදානම් සියල්ල සමාගම වෙත ඵලදායිව පැවරෙන මූල්‍ය කල්බදු සහිත දේපල, පිරියත හා උපකරණ ඒවායේ මූර්ත වටිනාකම මත ප්‍රාග්ධනිත කර දේපල, පිරියත හා උපකරණ ලෙස නම් කර කල්බදු දේපල භාවිතා කිරීමෙන් සමාගම බලාපොරොත්තු වන වාසිය කාලයට අනුකූලව ක්‍රමක්ෂය කර ඇත.

බදුහිමිකරු වෙත ගෙවිය යුතුවන අනුරූපී ප්‍රධාන මුදල බැරකමක් ලෙස දක්වා ඇත. ඉතිරිව ඇති බැරකම සඳහා ස්ථිර පොලී අනුපාතයක් ලබා ගැනීම පිණිස කල්බදු ගෙවීම් මූල්‍ය ගාස්තු හා කල්බදු බැරකම් අඩු කිරීම අතර සමානව බෙදා ඇත. කල්බදු කාල සීමාවට ගෙවීමට ඇති පොලිය අවිනිශ්චිත ගිණුමට පොලි මුදලක් ලෙස මාරු කර ඇත. එක් එක් මූල්‍ය වර්ෂයට අදාළව කුලියට ගත් ස්ථාන සඳහා පොලී ගෙවීම ආයුසණක ක්‍රමයට අනුව බදු කාලයට අදාළව මූල්‍ය ප්‍රකාශන වල බැර කර දක්වා ඇත.

## 2.3 බැරකම් හා ප්‍රතිපාදන

### 2.3.1 විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම්

**(ආ) ස්ථිර ප්‍රතිලාභ සැළසුම - පාරිතෝෂිත**

මෙම බැරකම ශේෂ පත්‍රයේ හුවා දක්වා ඇති අතර අපේක්ෂිත ඒකක මූල්‍ය ක්‍රමය භාවිතා කර ශේෂ පත්‍ර දිනයට ස්ථිර ප්‍රතිලාභ ගෙවීම තථ්‍ය වටිනාකම මත සකස් කර ඇත.

කෙසේ වුවද, 1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීමේ පනතට අනුව අඛණ්ඩ සේවයේ පස් වසරක් සපුරා තිබීම මෙම ගෙවීම සඳහා සුදුසුකම් ලැබීම අනිවාර්ය කර ඇත.

පාරිතෝෂිත බැරකම බාහිරව අරමුදල් යෙදවෙන්නක් නොවන අතර එම අයිතමය ශේෂ පත්‍රයේ ජංගම නොවන බැරකම් යටතේ දක්වා ඇත.

**(ආ) ස්ථිර දායකත්ව සැළසුම් - සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල**

අදාළ නීති රෙගුලාසි වලට අනුව සේවක අර්ථසාධක අරමුදල් දායකත්වයන් හා සේවක භාරකාර අරමුදලේ දායකත්වයන් සඳහා සේවකයන් සුදුසුකම් ලබති. සමාගම සේවක දළ වැටුපෙන් පිළිවෙලින් 12% ක් හා 03% ක් සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදල සඳහා ගෙවීම් සිදු කරයි.

**2.4 ප්‍රදාන හා සහනාධාර**

වෙළඳපල වටිනාකම මත ප්‍රදාන හා සහනාධාර හඳුනාගෙන ඇත. ප්‍රදාන/ සහනාධාර නියමාකරව හා අදාළ සියලු කොන්දේසිවලට යටත්ව සිදුවන බවට සාධාරණ වගකීමක් සහිත හා අවශ්‍ය වන තත්වයන් තුල ඒවාට අනුගත වන පරිදි සිදු කෙරේ. වියදම් අයිතමයකට අදාළව ප්‍රදානය හෝ සහනාධාරය සිදු වන අවස්ථාවලදී එය කාලයට අදාළ ආදායමක් ලෙස ක්‍රමානුකූල පදනමක් මත පිරිවැයට සමානව වන අයුරින් හඳුනා ගැනීමට සිදු කර ඇත.

ප්‍රදාන හා සහනාධාර යන්නෙන් මුදල්මය නොවන ප්‍රදාන ඇතුලු වත්කම් හැඳින්වෙන අතර ඒවා වෙළඳපල වටිනාකම් මත ශේෂ පත්‍රයේ විලම්බනය කර වත්කමේ භාවිත කාල සීමාව අනුව ආදායම් ප්‍රකාශන වල බැර කර ඇත.

**2.5 ආදායම් ප්‍රකාශනය**

**2.5.1 ආදායම් හඳුනා ගැනීම**

ආර්ථික වාසි සමාගමට අත්වීමට බලපාන ලෙස සහ ආදායම මෙන්ම ඒ සම්බන්ධිතව සිදු කළ අන්දමට එසේ නැතහොත් විශ්වාසදායි ලෙස ගණනය කල හැකි වන පරිදි පිරිවැය ආදායම හඳුනාගෙන ඇත. ලැබී ඇති හෝ ලැබීමට නියමිත වෙළඳ වට්ටම් හා අලෙවි බදු වල ශුද්ධ අගය මත වෙළඳපල වටිනාකම මත ආදායම ගණනය කර ඇත.

**(අ) නිෂ්පාදන අලෙවිය**
නිෂ්පාදන අලෙවි කිරීමෙන් ලත් ආදායම හඳුනා ගෙන ඇත. ප්‍රධාන අවදානම් හා භාණ්ඩ හිමිකාරත්වයේ වාසි පාරිභෝගිකයා වෙත පැවරෙන පරිදි භාණ්ඩ හඳුනා ගැනීම සිදු කර ඇති අතර, පොදුවේ හිමිකාරත්වයට අදාළ වන තලයේ කළමනාකරණ මැදිහත්වීමක් සමාගම කිසිදු රඳවා ගැනීමක් නොකර එසේ විකුණන ලද අයිතම වලට බැඳීමකින් තොරව එය සිදු කරයි.

**(ආ) පොලිය**
පොලී ආදායම පොලී උපචිතවීම් ලෙස හඳුනා ගෙන ඇත.

**(ඇ) වෙනත් ආදායම්**
වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

දේපල, පිරියත හා උපකරණ ඉවත් කිරිමේ හා ආයෝජන ඇතුළු ජංගම නොවන වත්කම් ආදායමක් වන ආකාරයේ ශුද්ධ ලාභ හා පාඩු ඉවත් කිරීමේ ගාස්තු, වත්කමේ ධාරන අගය හා වෙනත් විකුණුම් වියදම් අඩු කර ආදායම් ප්‍රකාශනය තුල දක්වා ඇත.

